# ඕස්ට්‍රේලියානු ආදිවාසිකයෝ

තස්මේනියාව ඇතුළු යුරෝපීයයන් විසින් සොයා ගනු ලැබූ අවධියේදී ඕස්ට්‍රේලියාවේ පදිංචි ව සිටි ඕස්ට්‍රලොයිඩ් ජාතිකයන් හැඳින්වීම සඳහා පොදුවේ භාවිතා වූ වචනයකි. (ආදි වැසියෝ) යන්න. යුරෝපීයයෝ මුල දී ඔවුන් ඉන්දියානුවන් ලෙස හැඳින් වූහ. ඇබොරිජිනීස් ඕස්ට්‍රේලියාවට පැමිණියේ අඩු වශයෙන් මීට අවුරුදු 40,000 කට ඉහතදී ය යන්න වර්තමානය පුරා විද්‍යාත්මක සාධකවලින් තහවුරු වේ.

වර්ෂ 1788 දී ඕස්ට්‍රේලියාවේ මෙකී ආදිවාසිකයන් 3,00,000 ක් පමණ විසූ බවට ගණන් බලනු ලැබ ඇත. එසේ වුවද, මෑතදී කරන ලද පර්යේෂණයන්ගෙන් හෙළිවන පරිදි, විශේෂයෙන් ම එහි ගිණිකොණ දිග ප්‍රදේශයෙහි, සංඛ්‍යාව මීට වඩා තරමක් වැඩිවන්නට ඇත.

යුරෝපීයයන් පදිංචිවීමට පෙර, මුළු මහාද්වීපයේ ම ආර්ථිකය දඩයම් කිරීම, ද්‍රව්‍ය එක්රැස් කිරීම සහ මසුන් මැරීම මත රඳා පැවති අතර, ජන සංඛ්‍යාන රටාව විශාල ලෙස වෙනස් විය. උත්සව ආදියට සහ සමාජමය යුතුකම් ඉටු කිරීම පිළිබඳ අවස්ථාවලදී පමණක් මිනිසුන් විශාල වශයෙන් එක්රැස් වූ අතර, ඒවා නිමවූ පසු බොහෝ කොට ඔවුහු විසිර ගියහ.

මෙබඳු ගෝත්‍රික ඒකකවල ජන සංඛ්‍යා ප්‍රමාණය දෙතුන් සීයේ සිට ඇතැම් විට දෙදහස දක්වා විය. භූගෝලීය ප්‍රදේශ පාරිසරික තත්ත්වයන් මත රැඳී පැවැති අතර, ඒවා නිෂ්පාදනීය වෙරළාශ්‍රිත කලාප යන්හි වර්ග කිලෝ මීටර් සිය ගණනක සිට කාන්තාර ප්‍රදේශයන්හි වර්ග කිලෝ මීටර් දහස්ගණනක් දක්වා ප්‍රමාණයක් විය. පැහැදිලි එමෙන්ම අන්‍යොන්‍ය වශයෙන් අවබෝධ කොට ගත නොහැකි කථා කරන භාෂාවල මුළු ගණන 200 කට අධික වන අතර දේශීය භාෂා සංඛ්‍යාව එමෙන් තුන් ගුණයකට අධික වේ. මෙකී භාෂාවන්ගෙන් 50 වැඩි ගණනක් අභාවයට ගොස් ඇති අතර, මිනිසුන් වැඩිදෙනා කථා කරන්නේ භාෂා 50 ක් තරම් සංඛ්‍යාවකි.

**සමාජ සංවිධානය සහ පාලනය**

යුරෝපීයයන්ගේ ආක්‍රමණයේ හා පදිංචිවීමේ සිට ගත වූ දීර්ඝ කාල පරිච්ඡේදය තුළදී ආදිවාසික සමාජ දැඩි වෙනසකට භාජනය වූ අතර, බොහෝ ප්‍රදේශ තුළ ගතානුගතික සමාජ සංවිධානය අතුරුදහන් වී ඇත. ස්ථිර පදිංචියකින් තොරව තැනින් තැන හැසිරීමේ සිරිත අතහැර දමනු ලැබූ අතර, ඒ සමගම පැරණි ස්වරූපයේ ප්‍රදේශබද්ධ සංවිධානය ද නැතිව ගියේ ය. යුරෝපීයයන්ගේ පැතිර යාම ප්‍රමාදව සහ අඩුවෙන් සිදුවූ පෙදෙස්වල පමණක් සම්ප්‍රදායික සංවිධානයේ අංග රාශියක් ඉතිරි වූ අතර, එකී ප්‍රදේශවල වුවද, යුරෝපීය බලපෑම ක්‍රමයෙන් වඩාත් ශක්තිමත් ව වැඩුණු හෙයින් එකී අංග බොහෝ වෙනස්කම්වලට භාජනය විය. ප්‍රතිඵල වශයෙන් ඇතිවූ කරුණු බොහෝවක් යටගිය තත්ත්වයන්ට අදාළ වන නමුදු රට අභ්‍යන්තර සහ උතුරු ප්‍රදේශවල බොහෝ ආදිවාසීන් සම්ප්‍රදායට නැඹුරු බවක් පවත්වා ගෙන යන අතර, ඥාතිත්වය සහ සමාජ සංවිධානයේ වෙනත් අංශ ඔවුන්ගේ ජීවිතයේ අතිශයින් ම වැදගත් අංග ලෙස තවමත් සැලකේ. සියලු දෙනා ම දැන් නීති දෙකක් යටතේ ජීවත් වන නමුදු සමාජමය පාලනයේ සම්ප්‍රදායික ක්‍රම, යුරෝපීයයන් විසින් ඇති කරන ලද ආදර්ශ සහ ක්‍රම සමඟ නොකඩවා ක්‍රියාත්මක වේ.

ආදිවාසීන්ගේ සමාජ සංවිධානය තේරුම් ගැනීම සඳහා මානව සමාජය ගොඩ නැඟී ඇති මූලික කොටස් හතරක් විශේෂ වශයෙන් වැදගත් වේ. එනම්, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ඥාතීත්වය (විවාහ නිසා හට ගැනෙන නෑ සබඳකම් ඇතුළු)සහ ප්‍රදේශය (තනි පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල නෑ සබඳකම්වල දී නිශ්චිත බිම් පෙදෙස් වශයෙන් ප්‍රකාශ කෙරෙන) යන මේවා ය. ශ්‍රම විභජනයේදී ස්ත්‍රී - පුරුෂ භේදයේ වැදගත්කම ඉතා ප්‍රකටව පෙනේ. පිරිමින් මූලික වශයෙන් විශාල කැලෑ සතුන් දඩයම් කරන්නන් වශයෙන් ද ස්ත්‍රීන්ශාබ ආහාර සහ කුඩා සතුන් රැස් කරන්නන් වශයෙන් ද සැලකේ. ස්ත්‍රී - පුරුෂ භේදයේ තවත් වැදගත් කාර්ය භාර ලක්ෂණයක් නම් ස්ත්‍රීන්



සාමාන්‍යයෙන් ළමයින් ඇති දැඩි කිරීමේ ප්‍රධානත්වයක් උසුලන්නියන් ලෙස ද පුරුෂයන් සමාජයේ ආගමික සිරිත් -විරිත් සමුදයේ ආරක්ෂකයන් ලෙස ද සැලකීමයි.

**සමාජ පාලනය**

ආදිවාසික ඕස්ට්‍රේලියාවේ නීතිය සිහින ලෝකයේ මැවුම්කාර ආත්මයන් විසින් කරනු ලැබූ නියමයන් ගෙන් ප්‍රභවය වූ බව විශ්වාස කෙරෙන අලිඛිත රීති මාලාවන් සේ අදහස් කෙරේ. හොඳ නරක දෙක වෙන් කොට හඳුනා ගැනීමට ළමයින්ට උගන්වනු ලබන අතර, සමාජය යහතින් පවත්වා ගැනීම සඳහා ඔවුන් අන්තිමේදී යොදා ගතයුතු සාරධර්ම සහ හැසිරීම් සන්තානගත කර ගැනීමට ඔවුන් දිරි ගන්වනු ලැබේ. මහාද්වීපයේ සෑම තැනකම, මුහුකුරා ගිය විවාහක පිරිමි, කණ්ඩායමක් වශයෙන් තම සමාජයන් සෑහෙන අන්දමින් පාලනය කිරීමෙහි නිතර වූහ. ඔවුහු තරුණයන් ක්‍රමානුකූලව හැඩ ගැස්වූහ.

**ආගම**

ආදිවාසීන්ගේ ආගම මහාද්වීපය මුළුල්ලේ ම එක හා සමාන වූවක් නොවී ය. ආදිවාසික සමාජ වෙන් වෙන් වශයෙන් ස්ථාපිත විය. ඒ එකක් එකක් සැලැස්ම අතින් ඒකාබද්ධ වූ නමුදු, එක්තරා දුර ප්‍රමාණයක් ඉක්මවා අනෙක්වා සමඟ පැවති අන්තර් ක්‍රියා සීමා සහිත විය. ඔවුන්ගේ කලාප -අභ්‍යන්තර කේන්ද්‍රීකරණය, වෙළඳ සම්බන්ධතා , උත්සව සහ වත් පිළිවෙත් යන මේවා සඳහා රැස්වූ අවස්ථාවලදී පැහැදිලිව දක්නට ලැබුණු පිටත බැලීමේ යොමු වීමක් මඟින් තුලනය විය. මෙබඳු එකතුවීම් නිසා ආගමික අදහස් පැතිරවීම් පහසු විය. එක් පොදු ලක්ෂණයක් වූයේ භූමිය කෙරෙහි ඔවුන් තුළ පැවැති බැඳීමයි. අනික නම් සිතුවිලි මැවීම සහ සදාතන සිතිවිලි දාමයක නිමග්නවීමයි.

යම් නිශ්චිත ආදිවාසික කණ්ඩායමක ආගම එකී කණ්ඩායමේ සාමාජිකයන්ගේ උරුමයට අයත් කොටස් වේ. සම්ප්‍රදායික වශයෙන් ඔවුන්ගේ ම බල ප්‍රදේශ ගැන සැලකීමේදී ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂයේම සාමාජිකයන්ට තමන්ට ආගමික වතාවත් සිදු කිරීම සඳහා වෙන් වූ පෙදෙසක් හෝ පෙදෙස් විය.

**ශිලා කලා**

ගලෙහි අඳින ලද සිතුවම් විශාල සංඛ්‍යාවක් මේ දක්වා ආරක්ෂා වී පවතී. ඉන් බොහෝවක් කෙළින්ම ආගමික වැදගත් කමකින් යුක්ත වන අතර, බටහිර ආර්න්හෙම් පෙදෙසේ කිම්බර්ලි සහ බටහිර කාන්තාරයේ ඇතැම් කොටස්වල සිදුකර ඇති පරිදි, ඇතැම් අවස්ථාවල දී නැවත සකස් කර තිබේ. ඒ කෙසේ වෙතත් " පුරා විද්‍යාත්මක ස්ථාන " වලට වඩා වැඩියමක් නොවන තැන් ද රැසක් ඇත.

ආදිවාසික කලා, සජීවී ශ්‍රේෂ්ඨ කලාත්මක සම්ප්‍රදායක් වශයෙන් පිළිගනු ලබමින් පවතී. අවස්ථා කීපයක් හැරුණුවිට , දහනව වැනි සියවසේ අග භාගය වනතුරු කලාවන් බහුල වශයෙන් කෞතුකාගාර සඳහා එකතු කරනු නොලැබිණ.

**සංගීත සහ නැටුම්**

ඕස්ට්‍රේලියානු ආදිවාසික සංගීත සහ නැටුම් පිළිබඳ අලිඛිත කලාවන් එක් කලාකරුවකුගෙන් තව කෙනෙකුටත්, එක් පරම්පරාවකින් ඊළඟ පරම්පරාවටත්, මුඛ පරම්පරාවෙන් පැවත ආවේ ය. වෙනත් අනක්ෂර සංස්කෘතීන් මෙන්ම, සම්ප්‍රදායික ක්‍රියාකාරී කලාවන්හි නිපුණයෝ ඔවුන්ගේ කලා රචනා ලේඛනගත නොකරනවා මෙන්ම සංගීත චින්තයන් මඟින් නොකියවති. ගී, නැටුම් සහ සියලුම වර්ගවල භාණ්ඩ භාවිතයට ගැනීම ගැන ඉගෙන ගැනීම කෙරෙන්නේ සිරිත් ලෙස සවන්දීම, බලා සිටීම හෝ සන්දර්ශනවලට සහභාගි වීම ද මඟිනි.


පුරා වෘත්තයන්හි එන පුද්ගලයන් හෝ ඇදහීම් සහ වීරාපදාන හා සම්බන්ධ කොටගත් ගී සහ නැටුම් එකී අයගේ මුවින් ම පිටවී පැවත එන දේ ලෙස විශ්වාස කැරේ.

**භාෂා**

පූර්ව යුරෝපීය යුගයේදී ආදිවාසික ජනතාව එකිනෙකට වෙනස් භාෂා 200 කට අධික සංඛ්‍යාවක් ද උපභාෂා විශාල සංඛ්‍යාවක් ද කථා කළහ. සමස්ත මහාද්වීපයේමත්, ටොරස් සමුද්‍ර සන්ධියේ බටහිර දූපත්වල ද භාවිතා වූ භාෂා මූලාරම්භ වශයෙන් එකිනෙකට සම්බන්ධ වේ. එසේ නමුදු, ඕස්ට්‍රේලියාවේ උතුරු සහ නිරිත දිග පෙදෙස්වල භාෂා මහාද්වීපයේ ඉතිරි භාෂාවන්ට හා එකිනෙක භාෂාවන්ට ද වෙනස් වේ.

සෑම ගෝත්‍රයකටම අඩු තරමින් එක් භාෂාවක් වත් වෙන් වශයෙන් තිබෙන හෝ තිබුණු අතර, බොහෝ පෙදෙස්වල පොදුවේ භාෂා දෙකක් හෝ කීපයක් විය.

ඕස්ට්‍රේලියානු භාෂාවන්ගේ විශාල බහුතරයක් අභාවයට යමින් තිබෙන අතර, බොහෝවක් දැනටමත් අභාවයට ගොස් ඇත. එක් එක් භාෂාවන් කථා කරන අයගේ සංඛ්‍යාව නිවැරදිව තහවුරු කිරීම බොහෝ විට අපහසු නමුත්, ආදිවාසිකයන් 45,000 කට අධික සංඛ්‍යාවකට ඕස්ට්‍රේලියානු භාෂාවක් ගැන යම් කිසි දැනුමක් තවමත් තිබෙන්නට හැකි ය.



**සංඥා භාෂා**


කථා කරන වචන වලින් අදහස් හුවමාරු කර ගැනීමට අමතරව, මුළු ඕස්ට්‍රේලියාවේම ආදිවාසීන් හට කුඩු මහත් වශයෙන් විස්තරාත්මක සාංඥා භාෂාවක් විය. එකිනෙකාගේ භාෂාවන් වෙන වෙනම කථා කිරීමට නොදත් ආදිවාසීන් අතර අදහස් හුවමාරු කරවා ගැනීමට ඉන් මඟ සැලසුණු නමුත්, වෙනම භාෂාවන් කතා කරන ප්‍රදේශයන්හි දී එක්තරා ප්‍රමාණයකට එහි වෙනස්කම් දක්නට ලැබුණි. ඇඟිලි, අත්, තොල් හෝ හිස යම් යම් ආකාරවල තැබීමෙන් හෝ යම් යම් ආකාරවලට ශරීරය චලනය කිරීමෙන් ද ඇති කැරෙන සංඥා විශාල සංඛ්‍යාවක් ඊට අයත් විය. දඩයම් කිරීමේදී හෝ සටන් කිරීමේදී හා ආගමික චතාවත් සිදු කිරීම වැනි නිශ්ශබ්දතාව පවත්වා ගතයුතු අවස්ථාවන්හිදී ගෝත්‍රියක් මේ ක්‍රමය භාවිතා කරන ලදී. ඒ ඒ සංඥාවලින් පුද්ගලයන්, නෑදෑකම්, වස්තු, සතුන්, ස්ථානදිසාවන්, වේලාව, ගතිගුණ, ක්‍රියාකාරකම් සහ කොන්දේසි සහ හුදු මානසික හැඟීම් ද ප්‍රකාශ වේ.

**ධූම සංඥා**

කථා කිරීමෙන් තොරව දුර සිටින අයට අදහස් ප්‍රකාශ කිරීම හා අදාළව ආදිවාසිකයන් ගේ සංස්කෘතිය තුළ දක්නට ලැබෙන තවත් අංගයක් නම් විවිධ ක්‍රම තුළින් දුමක් ඇති කිරීම මඟින් සංඥාවක් දීමයි. මේ අනුව, ඇතැම් විට දුම ඇති කිරීම පිණිස තණරොඩු පුළුස්සනු ලබන අතර, ගසක පොතු පතුරක් හෝ කොළ අතුරිකිල්ලක් හෝ රැගෙන ගින්දරට ඉහළින් අල්ලා ආවරණය කිරීම මඟින් උඩට මතුවෙන දුම්කඳ ට නැවත නැවතත් බාධා කරනු ලැබේ. එක් වරම ඒ පතුර හෝ අතු රිකිල්ල හෝ ඉවත් කරනු ලැබූ විට දුම් රොටු අහසට නගී. ධූම සංඥා මඟින් සංකේත ක්‍රමයට විස්තරාත්මක පණිවුඩ දෙන බවක් නොපෙනේ. එහෙත්, යම් යම් කරුණු සඳහා අවධාන යොමු කිරීමත් මඟ පෙන්වීමත් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමත් උදෙසා භාවිතා කෙරේ. උදාහරණයක් වශයෙන් කඳවුරක් කරා ළඟාවන ආගන්තුකයන් තම පැමිණීම සහ මිත්‍රශීලි අපේක්ෂාවන් එළිදරවු කිරීමට ද දඩයක්කාරයන් තම පවුලේ අය හෝ ප්‍රදේශබද කණ්ඩායම දඩයම් කරන ලද සතුන් සිටින තැන කරා යොමු කිරීමටත්, කඳවුරු බිමක් පිහිටුවන මිනිසුන් කඳවුර තිබෙන ස්ථානය ගැන ආහාර රැස් කරන ස්ත්‍රීන්ට දැන්වීමටත්, දුම් සංඥා යවති. මංගල උත්සවවලදී සහ ගෝත්‍රික රැස්වීම්වලදී කණ්ඩායම් පැමිණ සිටින බව ඇඟවීමටත් මෙකී සංඥා භාවිතා කෙරෙන අතර, කරලියට බැසීමේ හෙවත් මුල් පිරීමේ උත්සවවලදී මෙය කණ්ඩායම්වලට පැමිණීමට කෙරෙන කැඳවීමක් ලෙස ක්‍රියාත්මක වේ.

ඕස්ට්‍රේලියානු එන්සයික්ලෝපීඩියා පොතෙනි.

## ඕස්ට්‍රේලියාවේ අරන්ද ගෝත්‍රිකයන්ගේ ඇතැම් හස්තමුද්‍රා



1. ඔබ කවරෙක් ද?
2. ඔබට වුවමනා කුමක් දැන ගැනීමට ද?
3. ඔබේ උප කොටසේ නම කුමක් ද?
4. ඔබේ බන්ධුතා ලාංඡනය (ඔබ හඳුනා ගන්නා ලකුණ) කුමක් ද?
5. සයිපරස් අල ලාංඡනය
6. විච්චෙටි පිලා ලාංඡනය
7. වල් බළලා ලාංඡනය
8. ජලය
9. කුඩා උකුස්සා ලාංඡනය
10. කුඩා විච්චෙටි පිලා ලාංඡනය

11 - 15 උපකොටස්වල නම්

ශ්‍රීමත් බෝල්ඩ්වින් ස්පෙන්සර් සහ එෆ්. ජේ. ගිලන් අනුග්‍රහයෙනි.

